# 04 කලාවැවේ නිල් දියවර
## අපෙ අම්මා

පුළුල් ජීවිත අත්දැකීමක් වඩාත් සංක්ෂිප්ත කොට රසවත් ව ඉදිරිපත් කළ හැකි ආකාරය පිළිබඳ ඔබගේ දැනුම පුළුල් කර ගැනීමට මේ පාඩම ඉවහල් වනු ඇත.

නව පරපුරේ ගීත රචකයකු වන සුනිල් දයානන්ද කෝණාර මහතා මේ ගීතයෙහි රචකයා ය. ගීත රචනයෙහි ඔහු තුළ පවතින අපූර්ව වූ ප්‍රතිභාව අසීමිත වූ මවු සෙනෙහස කැටි කොට ගත් මේ ගීතයෙන් මැනවින් පිළිබිඹු වේ. රචකයා ගැමි පරිසරයක් හා ආගමික වටපිටාවක් යොදා ගීතයේ රසය තීව්‍ර කිරීමට සමත් වී ඇත.



ගමට කලින් හිරු මුළුතැන් ගෙට වඩනා
ඒ හිරු එළියේ නැණ මල් පොඩි පිපුණා
ඒ මල් සුවඳේ අද ලොව්තුරු සුව විඳිනා
කලා වැවේ නිල් දියවර අපෙ අම්මා

රෑ කළුවර අරගෙන දරුවන් එනතුරු සිත නෑ නිවන් දකින්නේ
රෑ කළුවර ඇවිදින් ඉකිබිඳ හැඬුවත් නෙත නෑ නිදි විඳ ගන්නේ
හෙට අරුණට සැරසෙන තව දවසක් ගැන නින්දේ සිහින දකින්නේ
මහමායාවෙනි කවදා දෝ ඔය නෙත් දරු සෙනෙහසින් මිදෙන්නේ

වෙල් දෙණිවල ඇවිදින දෙපා රිදෙන විට විහඟ ගීත බණ පද වේවා
බෝ මළුවක ඇවිළෙන පහන් වැටක් සේ තුන් සිත නිවී සැදේවා
මතු උපදින සසරේ විශාඛාව වී මෙත් මග නෙත් හමු වේවා
ඇත් රැජිනියනේ ඔබෙ නැළවිලි ගීතය ලොව ම නිවන කවියක් වේවා.

ගමට කලින් ..............................

## අරුත් පැහැදිලි කිරීම්

| | | |
|---|---|---|
| අරුණ | - | අලුයම |
| තුන් සිත | - | යම් ක්‍රියාවකට පෙර පහළ වූ සිතිවිලි යම් ක්‍රියාවක් කරන අවස්ථාවේ පහළ වන සිතිවිලි හා ක්‍රියාවෙන් පසු ඇතිවෙන සිතිවිලි |
| දෙණිය | - | මිටියාවත |
| නැණ | - | ඥානය |
| මුළුතැන්ගේ | - | කුස්සිය |
| ලොව්තුරු | - | ලෝකෝත්තර |
| විහඟ | - | පක්ෂීන් |

## ක්‍රියාකාරකම 01

i. මේ ගීතයට වස්තු විෂය වී ඇත්තේ කුමක් ද?
ii. ගීතයේ කියැවෙන අම්මා පිළිබඳ ව ඔබ තුළ ඇතිවෙන හැඟීම් කෙටියෙන් පැහැදිලි කරන්න.
iii. මවකගේ කෙබඳු ගුණ මේ ගීතයෙන් ඉස්මතු වී පෙනේ ද?
iv. මව සිය දරුවන් කෙරෙහි අසීමිත සෙනෙහස දක්වන බව හැඟවෙන ගී පද තෝරා ලියන්න.
v. අම්මා නිදි වර්ජිත ව කල්පනා කරන්නේ කුමක් පිළිබඳ ව ද?
vi. අම්මා ගැන කීමේ දී පහත දැක්වෙන යෙදුම් කොතෙක් දුරට උචිත වේ දැයි පැහැදිලි කරන්න.
    i. කලා වැවේ නිල් දියවර
    ii. මහමායාවනි
    iii. ඇත් රැජිනියනේ
    iv. විශාඛාව වී

## ක්‍රියාකාරකම 02

**පහත දැක්වෙන ගී පදයේ කළු කර ඇති පදය අධ්‍යයනය කරන්න.**

- බෝ මළුවක ඇවිළෙන **පහන් වැටක් සේ**
  පහන් වැටක් සේ යන යෙදුමේ ඇත්තේ උපමාවකි. ඒ බැව් හැඟවෙන්නේ "සේ "යන නිපාත පදයෙනි. මෙලෙස මෙන්, සේ, වැනි, එව්, වගේ යන නිපාත පද වර්ණනා කෙරෙන පදය සමග යෙදී ඇත්නම් එය උපමාවකි.

  පහත නිදසුන් ද විමසා බලමු.
  i. ගුරුතුමියගේ හදවත **වෙඬරු පිඩක් මෙන්** උණු විය.
  ii. ඔහුගේ ඇස් **ගොරක මද මෙන්** රතු විය.
  iii. සෙබළා **සිංහයකු සේ** ඉදිරියට ම ඇදෙයි.

- කලා වැවේ නිල් දියවර අපෙ අම්මා
  නිල් දියවර අපෙ අම්මා යන්නෙහි ඉහත ආකාරයේ උපකාරක පදයක් නොමැත. එහෙත් එයින් ද අම්මා වර්ණනාවට ලක්වේ. එබඳු යෙදුම් "රූපක" ලෙස හැඳින්වේ.

  පහත නිදසුන් ගැන ද අවධානය යොමු කරන්න.
  i. ඔහුගේ **ගල්හිත** කිසි විටෙකත් මෘදු නො වේ.
  ii. ඇගේ **මුවකමල** සිත් වශී කරයි.
  iii. බුදුරදුන්ගේ **අමාබස** සත්වයා සුවපත් කළේ ය.

## ක්‍රියාකාරකම 03

(අ) පහත දැක්වෙන ගීතයේ, ගීත ඛණ්ඩවල හා කවි පදවල උපමා හා රූපක වෙන්කර ලැයිස්තු ගත කරන්න.
" මිහි මඬලේ අඳුරු කුසේ - දිය උල්පත අම්මා
අහස් තලෙන් මරු කතරට - වහින වැස්ස අම්මා "

(ආ) i. "අම්මා සඳකි, මම ඒ ලොව හිරුය රිදී"
ii. "නෙත නිලුපුල් වත රතුපුල් කොඳ කැකුළු සිනා මල් "
iii. "වී පැදුරෙන් ඉගිලී යන කුරුල්ලකු ලෙසින් "
iv. "පසළොස්වක සඳ පායනු වැන්නේ "
v. "සද කිඳුරකු ලෙසිනා එම සඳ ඔබෙ රුව මට පෙනුණා"
vi. "දුනු කෙයියා මලක් වගේ දුරට පේනවා
වැටකෙයියා මලක් වගේ සුවඳ ගේනවා
පසළොස්වක සඳවාගේ එළිය ගේනවා
මගෙ අම්මා මට ජීවන සුවය සදනවා

## ක්‍රියාකාරකම 04

සිංහලයේ උපමා රූපක භාවිතය මෙන් ම පද කීපයක් උදෙසා තනි වචන යෙදීම ද දක්නට ලැබේ. නිදසුනක් වශයෙන් රාත්‍රියෙහි හැසිරෙන යන්න සඳහා නිශාචර යන්න යෙදීම දැක්විය හැකි ය.

මෙහි පහත "අ" තීරුවෙහි දැක්වෙන අදහස සංක්ෂිප්ත ව ප්‍රකාශ වන වචනය "ආ" තීරුවෙන් තෝරා ලියන්න.

| 'අ' තීරය | 'ආ' තීරය |
|---|---|
| 1. බොහෝ ඇසූපිරූ තැන් ඇති | වාච්‍යාර්ථය |
| 2. අසා රස විඳීමේ අරමුණින් ලියන ලද | ප්‍රතිභාව |
| 3. වචනයෙන් ප්‍රකාශ වන අදහස | ශ්‍රැතිගෝචර |
| 4. අපූර්ව වස්තු නිර්මාණය කිරීමේ හැකියාව | බහුශ්‍රැත |

### පැවරුම්

i. මේ ගීතය තාලානුකූල ව ගායනා කරන්න.

ii. වෙනත් මවු ගුණ ගීත ගායනා කොට මේ ගීතය හා සසඳමින් රස විඳින්න.

iii. මේ ගීතයෙන් හෙළිවන මවු සෙනෙහස මතුකර ගැනීම සඳහා පන්තියේ අනෙක් ශිෂ්‍යයන් සමග සාකච්ඡාවක් මෙහෙයවන්න.

iv. අම්මා පිළිබඳ ඔබේ අත්දැකීම් පාදක කරගෙන ගීතයක් හෝ කවියක් හෝ නිර්මාණය කරන්න.

v. මවු පිය ගුණ පිළිබඳ කියවෙන පැරණි හා නූතන ගීත එකතු කර කුඩා පොතක් සකස් කරන්න.